# නොමැකෙන මතකයන්

**(2023-2024)**



එම්.ඒ. ඔෂිනි මහවිතාන

# 2023 / 2024

# නොමැකෙන මතකයන්



## එම්.ඒ.ඔෂිනි මහවිතාන

**කෘතියේ නම : නොමැකෙන මතකයන්**

**(2023/2024)**

**කතෘගේ නම : එම්.ඒ.ඔෂිනි මහවිතාන**

**කතෘගේ වෙනත් කෘති**

- **රතු සපත්තු**
- **චාලි සහ සාලි**
- **අරුම පුදුම චාරිකාව**
- secret mission

**පිට කවර නිර්මාණය : එම්.ඒ.ඔෂිනි මහවිතාන**

**පාසල : මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය**

**ඉගෙනුම ලබන පංතිය : 11 A**

**කෘතිය පළ කරන දිනය :** 2026/05/20

ISBN : 978-624-211-102-5

# පිදුම

## මාගේ ආදරණීය මිතුරියන්ට



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා  සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සර් බී.ළස්. අකයහකෝන්,

ම්ඩුකකාරවර,මධ්‍යම පාාර.

සහ මාර්ර මහාචාමාය , හේරාහද්ණිය විය්වවිද්‍යාලය ය.

2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,  
දියවඩන නිලමේ,  
ශ්‍රී දළදා මාලිගාව  
2026.05.10

# පටුන


- හැඳින්වීම
- අලුත් පාරක්
- **P.T.S**
- අලුත් සමාජිකයා
- අලුත් දොරක්
- L.M.D.S. දවස්
- JJ පෙරගමන්කරු
- JJ absent
- Art Exhibition
- විභාග දවස්
- වෙසක් හෙඳිල්ල
- 9 වසර ආරම්භය
- Sportsmeet
- Big Match 2024
- අවුරුදු Season
- School Trip
- Grade 9 L.M.D.S.
- 2023/2

# හැඳින්වීම

මම ඔෂිනි.එහෙමත් නැත්නම් මේ පොත ලියන කෙනා. මම මේ පොත ලියන්නේ මට මගේ ජීවිතේ දැනුන සතුටුම කාලයක් ගැන කිව්වොත් හරි. ඒ මගේ 8 වසර 9 වසර කාලය ගැන 7 වසර පන්තියක් තිබුණා. ඒ මගේ පන්තිය.ඒක හරිම සහයෝගයෙන් කල් ගෙවුණු කාලයක් ඒ වගේම ඒ අවුරුද්දේ තිබ්බ දක්ෂම පන්තිය වුණා. කාලයත් එක්ක අපි 51 2023 දී 8 වසර ආවා.අපේ පන්තිය වෙන පන්ති වගේ නෙමෙයි. පන්ති ඔක්කොම එකට ඉන්න කොට අපි වෙනම නැටුම් කාමරේට එහා පැත්තේ ලොකු පන්තියක තනි වුණා. පස්සේ මටත් මගේ යාළුවොන්ටත් ඒක අතහැරලා යන්න බැරි වුණා. ඉතින් මං දැන් කියන්නම් කෝ ඒ පන්තිය මොන වගේද කියලා

ඒක අනෙක් පන්ති වලට වඩා ලොකුයි.මොකද බිත්ති 3කින් වටවෙලා එක පැත්තකින් විතරක් ජනෙල් තිබුණා. පන්තිය අයිනේ කොණේ බිත්තියේ ලොකු ගහක් අලවලා තිබුණා. පන්තියේ එලියේ ලොකු ගහක් තිබුණා. වැවේ හුළඟ පන්තිය ඇතුළට එනවා. ලොකු කොරිඩොවක් තිබුණා. චුට්ටක් ලොකු බැවුමක් තිබ්බා. ඔන්න ඕක තමා අපේ පන්තිය.

අපි එකට කොච්චර ආදරේ කරාද කිව්වොත් ඒක අපේ හිතේ රැඳුණ මතකයක්. අපේ පන්තිභාර වුණේ Science මැඩම් ඒ මැඩම් ට්‍රාන්ස්ෆර් වුණා. ඊට පස්සේ අපිට ආවේ ඩිස්නි මැඩම් ඒ මැඩම් හරිම හොඳයි. අපිසමහර දවස්වලට පන්තියට යන්නේ ජනෙල් වලින් පැනලා මොකද යතුර ගේන කෙනා පරක්කු වුණාම අපි හදිස්සි වුණාම හරි නැත්නම් ඉවසන්න බැරි වුණාම හරි.

# අලුත් පාරක්

අපි එක දවසක් Science Lab එකට ගිහින් පන්තියට ආවේ පුදුම බඩගින්නකින් යතුර පරක්කු වුණ නිසා. වෙනදා වගේම පනිමු කියලා අපි ලැස්ති වුණේ. කලින්ම පැන්නේ සහෙන්සි ජනේලය එච්චර උස නෑ. ඒත් එයා පැන්නා විතරයි. ඈතින් මධූ මැඩම් නැත්නම් Music මැඩම් ආවා. සහෙන්සි පනිනවා දැකලා.එයාට එළියට එන්න කියලා බැනලා ගැහුවා. එදායින් පස්සේ අපි ජනේලෙන් පනින එක නැවැත්තුවා.

අපි ඒ නිසා ලොකු අමාරුවක වැටුණා. අපිට මැඩම් ඇවිත් හොඳටම බැන්න නිසා.

# P.T.S

අපිට P.T.S පැවරුමක් තිබුණා. අපිට ඒක කරන්න තිබුනේ හරිම කැත ගබඩා කාමරයක් වගේ කැඩිච්ච පුටු, මේස, ටකරන් කෑලි,බට, අල්මාරි, පොත්, බාල්දි වගේ මහා විකාර දේවල් වලින් පිරුණු තැනක.එතන තමා අපිට වගා කුලුණක් හදන්න තිබුණේ. දවස් පහේ අතුගාන ළමයි විදිහට බෙදුණේ. මම සඳුදා කණ්ඩායමේ හිටියේ සනලි, ආශ්චර්යා, බිනුකි, පබෝදි, සෙතුමි, සහන්සා, මනීෂා, චමල්ෂා, දිව්‍යා සරලවම කිව්වොත් මේ හැමෝටම ට්‍රැක් පැනලා. මේ 10දෙනා තමයි P.T.S විකාර වැඩ වල එකට මාත් එක්ක වැඩ කරේ.අපේ leader සහන්සා.ඒයත් පිස්සුවක් නිසා අපිත් පිස්සු තමා නටන්නේ.අපිට වගා කුළුණක් හදන්නම පැය ගාණක් ගියා. වෙන කණ්ඩායම් වල පැල හදනකොට අපි තාම හදනවා. ඒ මදිවට කොහේදෝ බල්ලෙක් ඇවිත් ඒක හාරනවා.වෙලාවකට අපි හදන්නේ නැතුව පැත්තකට වෙලා බලන් ඉන්නවා. කොහොමහරි හවස ඉදලා, උදේම ඇවිත් ,Interval එකේ ඇවිත් ,අපි වගා කුළුණ හැදුවා.

අනිත් ළමයි වගා කුළුණ හදනකොට මං ඒ ළමයින්ට ඉදගන්න කැඩුණු පුටුවලින් බංකු හැදුවා.කාලයත් එක්ක අපේ වගා කුළුණ හොඳට හැදුණා. අපිට ඉදගන්න මං හදපු බංකු අපේ ළමයිගේ නිදහසේ ගත කරන්න තියෙන තැනක් වුණා. කොහොම කොහොම

හරි අපිට වගා කුළුණ හදන්න ඕනේ බඩු හොයාගත්තේ ගබඩා කාමරෙන් හරියට නිකන්

- උදැල්ල - කැඩුණු පුටු කැල්ලක්
- අත් සවල - පොල්කටු
- වතුර දාන්න - අයිස්ක්‍රීම් පෙට්ටි
- බඩු සඟවා තැබිමේ තැන - මළකඩකාපු බැරල් එක
- පොහොර - පොල්ලෙලි
- ඉදල - කූරු නැති ඉදල
  කොස්ස (දෙකට කැඩුණු)
- ආරක්ෂාවට - ඉරිච්ච මදුරු දැල

සමහර දවස් වලට අපේ Tools නැතිවෙයි කියලා දීපු අයගෙන් අරං ඇවිත් හංගලාත් තියෙනවා. ඔන්න ඔය වගේ විකාර Tool Set අපිට තිබුණා.අපිට අපේ වගා කුළුණු නිකන් එකක් වුණේ නෑ. එක අපිට හිතන විදිහ වෙනස් කරන තැනක් වුණා. අපිට අපි හැමෝටම මතක රැදුණු ගොඩක් වුණා.

# අලුත් සමාජිකයා

පන්තියේ ළමයි හැමෝම වගා කුළුණ හදනකොට ළමයෙක් දුවගෙන ඇවිත් අපිට කිව්වේ අලුත් ළමයෙක් ආවා කියලා. අපි හැමෝටම track නිසා හැමෝම මඩ අත් වලින් වගා කුළුණු වල වැඩ බිම දාලා උඩ පිට්ටනියට දිව්වේ අපේ පිස්සු පන්තියට ආපු ළමයා බලන්න. එයා හරි වෙනස් කෙනෙක් කළුයි ටිකක් කොටයි. එයාගේ නම ලක්මාලි. එයා පොළොන්නරුවෙන් ඇවිත් තියෙන්නේ එයාගේ අක්කි අපේ ඉස්කොලේ හිටපු නිසා නංගිත් අපේ ඉස්කෝලේට ඇවිත්. එයා ආපු වෙලේ ඉදන්ම අපේ මෝඩ ළමයි ප්‍රශ්න අහනවා ඉවරයක් නෑ.ඔන්න ඉතින් අපේ පන්තියට අලුත් ළමයෙක් ආවා.මෙයා කොහොම වෙයිද දන්නෑ.මුල් දවස්වල Hostel නිසා කොයිවෙලෙත් දුකෙන්.ඒ නිසා වෙලාවකට අඬනවා.මං එයාව සනසන්න නොකරපු දෙයක් නෑ. එයා ටික කාලයක් ඉස්කෝලෙත් එන්නේ නැතුව හිටියා. ටික කාලයක් ඔහොම වෙලා එයාටම හොඳ යාළුවෝ හම්බුණා. ඊට පස්සේ එයා සාමාන්‍ය විදිහට ඉස්කෝලේ ආවා.

සමහර විට අපේ පන්තියේ මෝඩ ළමයි දැකලා අපේ පන්තියට ආස වෙන්න ඇති.කොහොමත් අපේ පන්තිය කියන්නෙම අමුතු පිටසක්වලයෝ ඉන්න පන්තියක්. එයාලගේ ජිවිතේ හරිම අමුතු විදියට තමා ගෙවෙන්නේ.

# අලුත් දොරක්

උදේ ඉස්කොලේට මම වෙනදා වගේම 7.15 ට විතර ආවා.එතකොට අපේ පන්තියට උදේම එන ළමයි ටිකත් අර ලොකු කොරිඩෝවේ දිගා වෙලා zombies ලා වගේ පන්තියට යන්නේ නැතුව හිටියා. බලනකොට පන්තියේ දොර අරින්න යතුර නැතුව නැතිවෙලා .හිටියේ මන් ඉතින් හෙලනි ගාව තිබ්බ මොකක්දෝ tool එකක් ගත්තා. එයා (ඒක වල් ගලවන්න ගෙනාපු එකක්.) ඒ tool එක මට දුන්න. මම ඉතින් මගේ කම්මැලිකම යන්නෙත් එක්කම මං අර ලොක් එකට ගහගෙන ගියා. එක කැඩුණේ ආයෙත් ලොක් වෙලා වගේ පෙන්න පුළුවන් විදිහට. මන්වත් තාම දන්නේ නෑ මං කොහොමද එච්චර ශ්‍රේෂ්ඨ වැඩක් කරේ කියලා. ඒක ආයෙත් එළියෙන් ලොක් කරන්න පුළුවන් නිසා අපේ පන්තියේ පිටසක්වල ජනතාව පුදුම වාසි ගොඩක් ගත්තා. ඒ දොර නිසා අපි එදා ඉඳන් පන්තිය එළියෙන් ලොක් කරලා ඇතුලේ හැංගිලා හිටියා. අපිට ඕක ගොඩක් වාසි වුණේ Prefect අක්කිලා ඇවිත් අපිට drill එක practic කරන්න එක්කන් යන කොට උදේ රැස්වීම වලට යන්නේ නැතුව ඉන්නත් පුළුවන් වුණා. අපිට ඒ නිසා ඒ දොර මාරම වාසි වුණා.
ඒත් ඒක ගොඩක් කල් රහසක් වුණේ නෑ. මොකද අනික classes එක දැනගත්තා. ඒත් අපේ පන්තියේ වටිනම දේකට තිබුණේ

marker pen **එක විතරයි. ඒ නිසා පන්තියට මොකෙක් ආවත් ගන්න තියෙන්නේ ඕක විතරයි.**

# L.M.D.S දවස්

අපිට ඉස්කෝලෙන් කරන තරගයක් තියෙනවා. L.M.D.S එකේ singing සහ Drama Competition හා තව ගොඩක් ඒවා තියෙනවා ඒත් මේ 2ක තමා ගොඩක්ම තරගය වැඩී. මොකද singing එකේ ළමයි 35යි. Drama එකේ ළමයි 12 යි. මම ඔය 2කේම හිටියා. Drama එක ගැන කිව්වොත් පිස්සුවක්. මොකද ඒ කාලේ කරපු වැඩ අමතක වෙන්නෑ. අපි 8 වසරෙදි කරේ ළමා අනාථාගාරයෙන් පැනලා ගිහින් එයාගේ අම්මව හොයාගන්න Drama එකක් .මං ඒකේ අනාථාගාරයේ නරක ළමයා විදිහට තමා හිටියේ. Drama එක මොනාවුණත් එකට අපි වැඩ කරපු විදිය පට්ට.විශේෂම දේ තමා අපි හැමෝටම Track සහ පිස්සු පටන් ගත්තම ඉවර වෙන්නේ නෑ.Drama එකේ හිටියේ චමත්කි,මයුනි,අංජලී, අමාෂා, සහන්සා, කුවිඳි, උමන්දා, සනලි, මම අචිනි, ආශ්චර්යා, බිනුති තමා හිටියේ. ඉතින් අපි ඔක්කොම එකට මේ වැඩේ කරේ. අපි හැමදාම හවස හිටියා 4.30 වෙනකන්.අපේ English Madam කියලා තියෙන්නේ මැඩම් කෙනෙක් නැතුව හවස ඉන්න එපා කියලා. ඒත් අපි හොරෙන් හවස 6.00 විතර වෙනකන් ඉඳලා වැඩ කරා. මැඩම්ලාගෙන් බැණුම් ඇහුවා. අපි සමහර දවස්වලට පන්තියේ හිටියෙත් නෑ. මැඩම්ලාගෙන් වැඳ වැඳ Period ඉල්ලගෙන Practice කරා අපේ Practice කරන තැන තමා Auditorium එක

පිටිපස්සේ පඩිපෙළ ළඟ තිබ්බේ එතනට වැවේ හුළඟ එනවා. ලොකු පාරක් ඒ නිසා ඉඩ තිබුණා. අපිට අර මං කලින් කිව්ව ගබඩා කාමරේ ජරාවක් වුණාට drama දවස්වල එක අපිට දේවාලයක් වුණා. Drama එකේ Props හදන්න අපිට ඕන කරන බඩු ඔක්කොම හොයා ගත්තේ එතනින් සමහර වෙලාවට අපිට වැඩ කරන uncle ලා aunty ලා බනිනවා,ඒවා ඇඳලා දානවා කියලා.අපි මේ Props වලින් බාගේට බාගයක්ම හැදුවේ Drama එක තියෙන දවසේ උදේ (එහෙම කිව්වම ඔක්කොම හැදුවේ උදේ තමා)එදා නම් අමතක වෙන්නෑ මට කවදාවත් මොකද අපි වැඳලා වැඳලා Period ඉල්ල ගත්තේ මොකද අපි දවස් ගනන් පන්තියේ හිටියේ නැති නිසා. ඒ වුණාට අපි 12 ට උපරිම සහයෝගය දක්වපු අනිත් ළමයි කොච්චර හිටියද අතපසු වෙන note අපේ පොත්වල ලියලා දීලා පුළුවන් වෙලාවට ඇවිත් උදව් කරා.

ඉතින් එදා උදේ අපි Period ඉල්ලගෙන මං අර කිව්ව corridor එකේ බිම ඉඳගෙන බඩු හැදුවා. මහ ජරා ගොඩක හිඟා කනවා වගේ කාලා නැතුව හාමත් වෙලා වැඩ කරන කොට අපේ ළමයි අපිට සමහර අය කැව්වා. ඉතින් සහයෝගීකම උපරිමට ගියපු අපේ ළමයි අමතක කරන්න බෑ.ඉතින් අපි මැඩම්ලගෙන් බැනුම් අහගෙන වැඩ කර කර ඉන්නකොට අපේ ඉස්කෝලේ Principal Madam ආවා අපි ගාවට මැඩම්ට බයේ හිටපු අපේන් මැඩම් ඇහුවේ "මොකටද මේ ලැස්තිවෙන්නේ කියලී අපි විස්තරේ කිව්වම මැඩම් අපිට කිව්වේ අද දවසම ඔයාලට මං ගානේ මේ වැඩේ කරන් යන්න permission දෙනවා කියලා අපිට නිකං දෙවියෝ ගෙනත් දුන්නා වගේ දෙයක් ඒක. මොකද අපිට වේලාව තිබ්බේ නෑ

හදලා ඉවර කරන්න.අපිට පන්තියේ ළමයිගෙනුයි අපියි කොහොමහරි වැඩේ ඉවර කරා. බාධා ගොඩක් මැද මේ වැඩේ කරේ. ඇත්තටම කිව්වොත් අපිට ගොඩක් කල් මදි වුණේ අපි අනික් දවස් වල ගොඩක්ම කරේ මහ මොංගල් පිස්සු විකාර ඕපදූප කතා කර කර කාලේ කාපු නිසා.

අපි ලෑස්ති වෙන්න පරක්කු වුණා.ඒ වුණත් අපිට කෙහොමහරි හරි වෙලාවට එතනට ගියා. අපි වැඩේ plan කරපු විදියටම කරේ නැති වුණාට අපි හොඳට කරා කියලා අපි දන්නවා. කොහොම කොහොමහරි result දෙන දවසේ අපි ට place එකක් නෑ කියලා හිතාගෙන හිටියේ .අපි මාරම දුක් වුණා. ඒත් අපි 3rd කියලා කියද්දි දැනුන සතුට කියලා නිමක් නෑ. අපිට විශ්වාස කරනන් බැරි වුණා අපි 3rd කියලා.අහ් ! Singing එක තිබ්බෙ Drama එකට කලින් ඒකට නම් අපිට ලැබුණේ English Period එක විතරයි ඒත් අපි අනිත් Period උත් හොරෙන් ගත්තා.අපි ඒකටත් ගොඩක් මහන්සි වුණා.හවස දුක් විඳලා Interval එකේ කන්නේ නැතුව Practice කරා විශිෂ්ඨ ජයක් විදියට අපි එකෙන් 1st වුණා ඉතින් section එකේ දඟම විකාරම පන්තිය competition වලින් place එකක් ගත්තා. අනික අපි හැමෝම එකට ඉන්නවා කියන්නේ පිස්සුවක් තමා ඒ වගේම හොඳටම track පැනපු මාරම Drama crew එකක් ඇත්තටම මේ ඔක්කොම දේවල් වුණේ ගොඩක් රණ්ඩු මැද මං ඒවා මතක් කරන්න කැමති නෑ. ඇත්තටම සමහර අය තරහා වුණා. ඒවා මතක් වෙනකොටත් හිනා යනවා මොනා නැතත් අපි ඒ හැමදේම හොඳට කරා.

# J.J පෙරගමන්කරු

අපේ ඉස්කොලේ Principle ට බල්ලෙක් හිටියා.එයා සුදු බූල් වැවුණු හරි cute කොට බල්ලෙක් මට නම් ඇති cute ගතියක් පෙන්නේ නෑ.ඒ බල්ලා principal මැඩම්ගේ බල්ලා නිසා principal යන හැමතැනම ඒ බල්ලා යනවා මොකක්හරි school show එකක් day එකක් මොකක්හරි රැස්වීමක් වුණත් ඒ බල්ලා යනවා.ඒ බල්ලා අපේ ඉස්කොලේ විතරක් නෙවෙයි වෙන හැම ඉස්කොලේකම වගේ ප්‍රසිද්ධයි මොකද ඒ බල්ලd Invite schools වලින් එන show වලටත් එනවා. එයා stage එක උඩට ගිහින් සමහර වෙලාවට බුරනවා. ඒ බල්ලාාට මොළයක් නැති නිසා වෙන්න ඇති නැත්තන් ඒ බල්ලගේ හැටි වෙන්න ඇති.

මට නම් ඒ බල්ලා එළුවෙක් වගේ තමා පේන්නේ මං ඒ බල්ලාට පොඩ්ඩක්වත් කැමති නෑ. ඔයාලා හිතයි ඇයි මං ඒ බල්ලට කැමති නැත්තේ කියලා. මං ඒක පස්සේ කියන්නම් ඇත්තටම එළුවෙක් වගේ එයා දුවනකොට එළදෙනෙක් වගේ තමා මට නම් පෙන්නේ.මේ බල්ලා අපිට ගොඩක් වාසි වුණා.ඇයි දන්නවද මං කලින් කිව්ව වගේ මැඩම් යන හැමතැනම j.j (බල්ලා) එනවා කියලා. අපි කෑ ගහලා,සිංදු කියලා, නටන වෙලාවට අපිට බේරෙන්න පුළුවන් විදිහක් තමා ඒ මොකද ඒ බල්ලා ළඟපාත ඉන්නවා කියන්නේ Principle Madam ළඟ ඉන්නවා කියන එක J.J පන්තිය ළඟ නම්

එතකොට අපි මාර සිල්වන්තයි සමහර වෙලාවට අපි පාඩම් කරනවා... අපිට සම්පතක් ඒත් මං කැමති නෑ.පස්සේ කියන්නම් ඇයි කියලා.......

අපේ Principle මැඩම් ටිකක් සැරයි.ටිකක් හොඳයි.අපිට ඒවා අදාළ නෑ අපි කොහොම බයයි.

ඒ බල්ලා හිතාගෙන ඉන්නේ එයා හරි ලොකු වැඩ්ඩෙක් කියලා. එයා වෙන බල්ලොන්ට බුරනවා.ඒත් ඒ බල්ලෝ බුරව්වොත් J.J දුවනවා. දවසක් මාව හපන්නත් ආවා,

# J.J ABSENT

අපිට සමාන්‍ය විදියටම එදත් ඉස්කොලේ තිබ්බා. නිකන් සෙල්ලම් කරලා, කාලා, ඉගෙනගෙන හිටියා. අපිට කොහොමත් interval එකට පස්සේ period එපාවෙනනවා,අපිට නිකන් පරලොව ගියා වගේ එතකොට අපිට හේතු නැති වුණාට අපි කැමති නිකන් ඉන්න.ඉතින් අපිට interval එකෙන් පස්සේ තිබ්බ Civics වැරසදා එකේ මැඩම්ට එන්න බැහැලු වැඩක් තියෙනවා කියලා අපිට පැවරුමක් දුන්නා. අපිට පැවරුමක් ගෙදර ගිහිනුත් කරන්න පුළුවන්නේ කියලා ළමයි ඒ පැවරුම නොකර සෙල්ලම් කරලා ජොලියේ හිටියේ. අපේ අවාසානවට J.J එදා absent වෙලා අපි කෑ ගහගහ ඉන්නකොට principal madam ආවා මොනා කරන්නද J.J absent නම් කලින් කියන්න තිබ්බා. "දැන් මොනාද තියෙන්නේ කියලා ඇහුවම අපේ ළමයිගේ අවංකකම නිසා civics කිව්වා. පැවරුමක් දීලා කියලා දැනගත්තට පස්සේ මැඩම් අපේ පොත් බලන්න ආවා. පැවරුම කරලාද බලන්න අවාසනාවට පැවරුම අපි කරේ නෑ. ළමයෙක්ට ගිහින් කෝට්ටක් අරං එන්න කිව්වම ඒ ළමයා යන්නේ නැතුව හිටියා.ඒකටත් තරහ ගිය මැඩම්, මැඩම්ම ගිහින් කෝට්ටක් උස්සන් ඇවිත් අපිට පෝලිමට එන්න කිව්වා. පන්තියෙන් එලියට යන්න දොර ගාව හිටගන්න කියලා කකුළට කෝට්ටෙන් ගැහුවා.

එච්චර රිදෙන්නේ නැති වුනාට රිදුණ වගේ තමා අපි හැමෝම හිටියේ එදා ඉඳන් අපිට දෙන පැවරුම වෙලාවට කරා.ඒක තමා පන්තියේ ළමයි හැමෝම principal ගුටි කෑව පළවෙනි වතාව ඒකත් මැඩම් හොයාගෙන ආපු කෝට්ටක්. J.J absent වෙනවට අපි ටිකක් විතර දැන් අකැමති. (ඒත් මං නම් කැමති)

# Art Exhibition

අපිට අපේ ඉස්කෝලෙa art exhibition එකක් තියෙනවා.හැම අවුරුද්දකම 2023 අපි exhibition එකට මොනාහරි කරමු කියලා art sir ගාවට ගියා. exhibition එකට මොනාහරි හදන්න ඕනේ නිසා sir කිව්වා වෙනස් දෙයක් කරමු කියලා.ඒ නිසා අපි Cupboard Man කෙනෙක්ව හැදුවා. ඒ තමා ඔෂින් ඒකාටත් මගේ නම දැම්මේ මම ඉඳගෙන ඉන්න විදිහ බලාගෙන හදපු නිසා අපිට exhibition එකට මාසයක් වගේ තියෙද්දි තමා අපි ඒක හදන්න ගත්තේ.ඒක හදන එක ලේසි නෑ කියලා හිතුනේ දවස්වල තමා.... අපි cupboard බට ගෙනල්ලා ඒවා නමලා ගැට ගහලා ඇඳුම් හදලා එකට ඕනේ කරන හමේ පාට අලවලා ඒ වැඩ ඔක්කොම කරේ හවස ඉඳලා වගේ තමා ඒත් සමහර දවස් වලට අපි class period වලත් ඇවිත් හැදුවා.අපිට ජකී teacher permission දෙන්නේ නැති වුණාම අපි first period එකේ ඉදලා 2nd period එකේ art room එකට ගිහින් ඔෂින් (කාඩ්බෝඩ් man ට කියන නම) ව හැදුවා.ආහ් ... අපි එක හදන්න කලින් කම්බි ඔතලා මනුස්සයෙක්ව හැදුවා. අපි... කිව්වට කවුද කිව්වේ නෑනේ . තිනාලි, මම, සනලි, සහන්සා, විනුදියි, සවිනුලා, කවිෂ්කා,

පබෝදි, මයුනි තමා හිටියේ චමත්කි, අංජලි, අචිනි, 3න්දෙනා ලොකු මුහුදක්

ඇන්දා ඒක ගොඩක් ලස්සනට තිබ්බා. (අපි ඒ මුහුදට කරන්න හදපු දේවල් ගොඩායි, හරියට නිකන් මල් වැල් අදින්න වගේ......)
art exhibition එකට කලින් දවසේ තිබ්බේ photo graphic exhibition එක එදා අපේ අයියට prize එකක් තිබිලා එයත් ආවා අපේ ඉස්කෝලෙට අපි ටිකත් ගියා චයදචී බලන්න.එතකොට අයියා ඉන්නවා කියලා විනුදි පිටිපස්සෙන් මාව තල්ලු කරා කතා කරන්න කියලා එතකොට සහන්සා මට ඉස්සරහ හිටියේ තව පොඩ්ඩෙන් අපි දෙන්නා invite schools ඉස්සරහ බිම වැටෙනවා
එක ඉවරවෙලා ආයෙත් ගියා ඔෂින්ව හදන්න.එතකොට හවස හිටපු නිසා free milk packets හම්බුණා.(එක්කෙනෙක් 7ක් විතර බොන්න ඇති)
කොහොමහරි exhibition එක දවසේ අපේ ඔෂින්ව ලස්සනට හදලා තිබ්බා එහෙම ඇවිත් එක පටන් ගන්නකොට අර කියන බල්ලා අපේ ඔෂින්ට බය වෙලා බුරන්න
ගත්තා. අපිට ඒ නිසා ඔෂින්ව තාවකාලිකව එතනින් අයින් කරන්න සිද්ධ වුනා. ඒ නිසා අපිට මාරම අවුල්.එ නිසා තමා ඒ බල්ලට මං කැමති නැත්තේ.ඇත්තටම එතන හිටියේ නැත්නම් මායි යාළුවොයි ටිකයි ඒ බල්ලට හොඳ දෙයක් කරලා තමා ඉවර කරන්න.තඩියා එක ලස්සනට තිබුණා. එකට අපි හදපු ඔෂින්ගේ බාගයක්ම හැදුවේ අපේ එනිසා තමා ලස්සන තිබ්බේ.

# විභාග දවස්

විභාග දවස් කියන්නේ කොයි කාටත් එපා වුණු දවස් වුනාට අපිට 8 වසරේ නම් පට්ට මං අර කිව්වා වගේ විභාගය තිබ්බේ අපේ අර පන්තියේ අපි ඒ කියන්නේ පළවෙනි එකේ 20 දෙනා තමා කොරිඩෝ එකේ ලිව්වේ හරියටම කිව්වොත් පිස්සු නටන සෙට් එක. අනිත් ළමයි 32කම ලිව්වේ පන්තිය ඇතුලේ එයාලා බුද්ධිමත්ම ළමයි ටික (ඒත් 52කටම හොඳටම track) ඇත්තටම ඉතින් අපි copy කරන්නෙත් නෑ.හැබැයි පේපර් එක ලියලා ඉවරවෙලා කථා කර කර නම් ඉන්නවා. මං හිටියේ පන්තියේ ජනේලය ගාව මට පන්තියේ ළමයි ලියන ඔක්කොම දේවල් පේනවා හැබැයි පැහැදිලි නෑ. එළියේ ඉන්න අය කොහොමත් එක ලියලා ඉවර වෙලා කථා කර කර තමා ඉන්නේ අපි 20දෙනාට දෙවියෝ තමා පට්ටම පිහිට වෙන්නේ....වහින වෙලාවට අපි ජැකට් දාගෙන ගුලි ගැහිලා ඉන්න ඕනේ වහින කොට හුලඟත් ආවාම තවත් පට්ට.අපි ඔක්කොම තෙම්ච්ච කුකුළෝ වගේ

අව්ව වෙලාවට මාර දාඩියයි. ground එක මැද එක ලියනවා වගේ වෙන grade වල සමහර අය කොරිඩෝ එකේ යනකොට අපේ දිහා බලන් යනකොට නිකන් මොකක්දෝ වගේ ඒ විතරද බල්ලෝයි, පූසෝයි එළුවොත් (J.J) යනවා.අහ් තව V.I.P රිළව් ඉන්නවා එයාලා එනකොට අපි බඩු උස්සන් දුවනවා. පාරේ යන වාහන දිහා බලාගෙන ඉන්නවා. (කන්දක් තමා අපේ ළමයිට පේන්නේ කෙලින් බැලුවම) කන්දේ ගෙවල් වල මිනිස්සු රෙදි වනන හැටි බලන්

ඉන්නවා. වෙන grade වල ළමයි කෑම කකා ඇවිදින හැටි බලන් ඉන්නවා.පේපරේ ඉවර වෙලා නිදාගන්නවත් බෑ අපි 20 දෙනාට ඇයි මොනා වෙයිද දන්නෑ නේ. කොරිඩෝ එකට වෙන්නෙම මාර වැඩ අහ්! තව අපේ  පේපරේ එහෙමත් හුලඟකට යනවා.මේ වැඩ එක්ක කොහොම කොපි කරන්නද මං දැන් කිව්වේ 8 වසර 1st term එක ගැන  නේ 2nd term, 3rd term දෙකම තිබ්බේ heaven එකේ ඒ කියන්නේ අනිත් 8 වසර class තියෙන එකේ. අපි ඉතින් ඉස්කෝලේ තියෙන උසම තැනට යන්න ඕනේ උදේම අක්කිලාත් එක්ක ලියන්න ඕනේ

අපි ඔක්කොමලා එහෙට ගියාම නිකන් හරිම අමුතුයි.සමහර අයව දැකලත් නැහැ.මට කොහොමත් බිත්තියක් අයිනේ තමා හම්බවෙන්නේ ඒත් ඒවා බිත්ති නෙමේ. බෝඩ් වර්ගයක් ඉතින් හේත්තු වෙන්න බෑ අනිත් පැත්තට නැමෙනවා. මං ගාව උඩම තියෙන්නේ ෆෑන් එකක් මට හැර අනිත් හැමෝටම හුළං එනවා. මට පන්තියම පේනවා අයිනේ නිසා. එහා පන්තියේ ඉන්න ළමයාගේ කකුළ බෝඩ් එකේ වැදුනම. මං බෝඩ් එකට ගැහුවා වගේ මං දිහා බලං ඉන්නවා. 1st Term වගේ නොවුණට පේපර් එක ඉවරවෙලා stepler මාල, චිත්‍ර අඳින, පෑන් වලින් සෙල්ලම කරනා ළමයි දිහා බලන් ඉන්නවා කොපි කරන ළමයි දිහා බලන් ඉන්නවා. silent වුණාම කොළයක්වත් 2කටවත් ඉරා ගන්න බෑ. සද්දයි stepler කරනකොට කලින්ම කරන ළමයා වැඩ්ඩෙක් කියලා හිතන වෙලාවලුත් තියනවා. කම්මැලි හිතුනම නිදාගන්නවා. නිදාගන්න බැරි වුණාම නිදාගෙන ඉන්න ළමයිට කථා කරනවා වගේ හරි

ආදරණීය වැඩත් තියනවා. විභාගේ කාලේට ඔරලෝසුවක් තියනවා කියන්නේ මාර වැඩ ගොඩක් පැවරෙන්නේ, නිදාගන්නකොට විනාඩි 5න් කථා කරන්න තියනවා. හෙන අමාරුවෙන් වේගෙන් ලියන අයට වෙලාව කියන්න තියනවා වගේ වැඩ ගොඩක් තියෙනවා. ඉතින් ඔහොම තමා අපේ 8 වසර විභාගේ ලිව්වේ විභාගේ ඉවර වෙලා අනිත් ළමයි ඒ තැන් වලම කෑගහන්න බැරුව ඉන්නකොට අපේ පිටසක්වල ජනයා අපේ පන්තියේ ෆන් එක අරගෙන කෑ ගහලා ජොලියෙ ඉන්නවා.කොහොමත් 8-B එකත් එක්ක අනිත් classes තරහයි. අදටත් ඒ හේතුව දන්නේ නෑ.

# වෙසක් සිල්

අපිට ඉස්කොලේ වෙසක් පෝයට සිල් ගන්න ඕනේ.ඉතින් අපි හැමෝම පන්තිය අස් කරන්න ඕනේ.ඉතින් අපි හැමෝම පන්තිය අස් කරන්න ඕනේ සිල් නිසා ඩෙස්ක්, පුටු එළියට දාලා බිම අතුගාලා මොප් කරන්න ඕනේ නැත්තන් බිම වාඩි වෙලා කන්නේ කොහොමද ඉතින් අපි ඔක්කොම බිම අතුගාලා ඉන්නකොට මට නිකන් හිතුණා මොප් කරන්න ඕනේ කියලා. ඉතින් මමයි, සහන්සායි, සහෙන්සි මොප් එකක් කොහෙන්දෝ හොයාගෙන ඇවිත් මොප් කරන්න පටන්ගත්තා. (ඒ මොප් එක washroom mop එකක්)

මොප් කරන්න පටන්ගත්තා විතරයි පන්තියේ මාර දූවිලි ගොඩක් තිබිලා තියෙන්නේ.ඒ නිසා මොප් කරන්න කරන්න මඩ වෙනවා කියලා දන්න නිසාත් මඟ වැඩේ දාලා යන්නත් බැරි නිසා අපි කෑම පෙට්ටි ඔතලා තිබ්බ ලේන්සු අරන් මොප් කරා.පන්තියේ අනිත් අය මහා ගොං හරක් රැලක් වැඩේ කරනවා වගේ බලන් හිටියා. වැඩේ ඉවරවෙනකොට මේසුයි, ගවුමයි, ලේන්සුවයි, කලු පාට වෙලා හිඟන්නු වගේ වැඩේ ඉවරවෙලා අපිට අමාෂා ෆේස් වොෆ් එකක් දුන්නා ගවුමයි මේසුයි හෝදන්න ලේන්සු ටික විසික් කරා. පහුවදා උදේම පන්තියට යනකොට ළමයි සෙරෙප්පු දාගෙන ඇවිදිනවා. මොනා කරන්නද සිල් ගන්නනේ ආවේ.හැබැැයි මගේ ගොං idea එක සාර්ථක කරගන්න උදව් වුණ සහන්සාටත් ,සහෙන්සිටත් ᵖ බෙහෙවින්ම ස්තුතියි. මේක කියවන දවසට සමහර ගොං වැඩ මතක් වෙයි.

# 9 වසර ආරම්භය

අපිව 9 වසරේදි පන්ති මාරු කලේ නෑ ඒත් කටකතා ආවා මාරු කරනවා කියලා.අපිට අපේ අලුත් ක්ලාස් ටීචර් විදිහට ආවේ සී.සිරිවීර කියලා මැඩම් කෙනෙක්. අපි දැනගෙන හිටිය විදිහටනම් සී.සිරවීර මැඩම් කියන්නේ ගොඩක් සැර මැඩම් කෙනෙක් කියලා.ඒ මැඩම් අපේ ඉස්කොලේ විනය භාරව වැඩ කරන මැඩම් කෙනෙක් මුළු සෙක්ෂන් එකේම ළමයි ඒ මැඩම්ට බයයි.ඉතින් අපේ අනිත් පන්තිවල ළමයිනුත් ඇවිත් අහන්නේ ඔයාලා කොහොමද ඉන්නේ කියලා. අපි උදේට මැඩම් ඉන්න වෙලාවට ගොඩක් බයෙන් තමා ඉන්නේ.අපිට එහා පන්තියේ ළමයි තමයි ගොඩක් ම බය. මොකද ඒ ළමයිට තමයි මැඩම් වැඩිපුරම බැනලා ඇත්තේ. මැඩම් පන්තියට එන වෙලාව පන්තිය හරිම සංවරයි.එහා පන්තිය ගුටි කනකොට තමා අපි දන්නේ මැඩම් එන ගමන් කියලා.එක දවසක් ගයිඩන් කරන ළමයි හැමෝම ඔඩිටෝරියම් එකේ වැඩකට ඇවිත් හිටියා.

අපි 9 - B ක්ලාස් එකේ ගයිඩ්ස් ටිකයි 9-A එකේ ගයිඩ්ස් ලා විතරයි. සී.සිරවීර මැඩම් එනවා දැකලා අපි හිටගත්තා. ඒ වෙලාවේ 9-A ළමයි හිටියේ නෑ අපි ඔඩිටෝරියම් එකේ 9-A එකේ ළමයි හෙව්වා ඒත් බයකට මෙයාලා මැඩම් එන විනාඩියට මේ මිනිස්සු තිබ්බ වැඩෙත් දාලා හැංගෙන්න දුවලා. ඒ මැඩම්ගෙන් අපි මාරටම ගුටි කාලා ඇති. අපිට ගහන සද්දෙට දෙපැත්තේ ජකීි වල ළමයිනුත් බයයි. සමහර වෙලාවට මැඩම් interval එකේදි class එකේ හිටියොත් අපේ classes 3ම නිශ්ශබ්දයි.ඒ තරම් බයයි. ඒ මැඩම් ට

මාත් ගොඩක් බයයි.හැමෝම වගේ බයයි.හේතුවක් නැති වුණත් අපි ගොඩක් බය වුණා.ඒත් අපේ ක්ලාස් ටීචර් නිසා අපි ගැම්මෙන් තමා හිටියේ සෙක්ෂන් එකම මාරම බයයි.හැබැයි පස්සේ තමා තෙරෙන්නේ ඒ හැමදේම කරන්නේ අපිට ආදරේ ට කියලා.ඒ මැඩම් මාරම හොඳයි.

# Sportsmeet

අපිට ස්පෝර්ට්ස් මීට් කාලේ කියන්නේ එපා කරපු කාලයක්.ඒ වුණාට මේ ස්පෝර්ට්ස්මීට් එක වෙනස් දෙයක්.අපේ අම්මා හැම අවුරුද්දෙම මාව ගෘප් ඉවෙන්ට්ස් වලට යවනවා.මේ පාරත් මං ගියා ගෘප් ඉවෙන්ට්ස් වලින් මං කරපු ඉවෙන්ට් එක ෆස්ට් වුණා.මං ඩ්‍රිල් එකටත් ගියා.ඩ්‍රිල් එකේ අපේ ඇක්ටිවිටිස් කරලා ටිකක් වෙලා ඉන්න තියනවා ස්පොර්ට්ස් වගයක් ඇවිත් අපි ඇඳලා තියෙන රවුම මැද කරන්න ඕනේ .ඉතින් පන්තියේ භාගෙට භාගයක්ම කරන්නේ කරාතේ නිසා එගොල්ලෝත් හිටියා ඒ වගේ විශේෂම දේ ප්‍රැක්ටිස් වලට එන්න කියද්දී නොයා අක්කිලාට හැංගිලා ඉන්න එක කොහොමහරි ස්පෝර්ට්ස්මීට් ඉවර වුණා.ඒත් අපේ හවුස් එක 4th වුණා. හැබැයි ස්පෝර්ට්ස් මීට් එක ඉවර වුණේ රෑ 8ට විතර අපිට නටන්න බෑන්ඩ් එකෙන් සිංදුත් ගැහුවා. පස්සේ අන්තිමට මල් වෙඩි දැම්මා. එච්චර දෙයක් නැත වුණාට යාළුවෝ හැමෝම ට්‍රැක් පැනපු අය නිසා එදා දවස හිනා වෙලාම මැරෙන්න පුළුවන්. මේ chapter එක කියවන කොට මතක් වෙයි, ඒ පැය ගානටම පිටසක්වලයෝ ටික කරපු ගොං වැඩ

# Big Match 2024

මේ පාර බිග් මැච් එක ඕර්ගනයිස් කරලා තිබුණේ අනෙක් ඉස්කොලේ.ඉතින් අපි හිටියේ වෙනදා ඉඳගන්න තැන නෙමේ අනිත් පැත්තේ. අපි කෙහොමහරි මාරටම එන්ජෝයි කරපු මැච් එකක් වුණාට අපිට ඒ කියන්නේ අපේ ඉස්කොලේට වින් කරන්න බැරි වුණා.ඒත් අපි ගොඩක් ෆොටෝස් ගත්තා. ඒ වගේම ඒ දවස් වල සීදේවී සිංදුව trending ගියා.එදා ඒ සිංදුව දැම්මා අපි හැමෝම ඒ කියන්නේ ඉස්කෝල දෙකම ඒ සිංදුවට එකම විදියට ඩාන්ස් කරා.ඒක ගොඩක් ෆන්. අව්වට පිච්චුණත් අපි හැමෝම අපේ ඉස්කෝලේට චියර් කරන එක නැවැත්තුවේ නෑ.කෑ ගහලා අන්තිමේට කටහඬත් නෑ. අපි අනිත් ඉස්කොලේ ට්‍රෝෆි එක ගන්නකොට මාර දේවල් කිව්වේ. වැරදි ටෝෆි එක කියලා. වට්ටක්කා හොද්ද හෝදලා නෑ කියලා (අපහාස සඳහා නොවන බව සලකන්න)

අපි මැච් එක ඉවර වෙලා අපි හැමෝම බස් එකට යනකොට අනිත් ඉස්කෝලේ ළමයි අපිට එක එක ඒවා කිව්වට අපි මුකුත් කිව්වේ නෑ.ඉතින් අපි හැමෝම බස් එකට නැගලා යන්න හදනකොට ඒ අපි යන බස් එක නෙවෙයි කියලා අපිට බහින්න කිව්වා.අපි බහින්න යනකොට (ඒ කියන්නේ ළමයි 5ක් විතර) බස් එක යන්න ගත්තා අපේ පන්තියේ අනිත් ළමයි ඔක්කොම බැහැලා.මමයි තව ළමයෙකුයි කෙහොමහරි බැස්සා.ඒත් තව ළමයි 3

දෙනෙක් බස් එක ඇතුලේ එයාලා යන්න ගියා. අපි අපිව ගන්න ආව ආන්ටි එකක් ගියා බස් එක පස්සේ දිව්වා අනිත් අයව ගන්න.

කොහොමහරි අත දාලා බස් එක නවත්ව ගත්තා. එයාලා බැහැලා අපි අපේ පන්තිය ඉන්න බස් එකට ගියා හැමෝම අපිව හොයනවා. කොහෙද හිටියේ කියලා අපෙන් අහනවා.බස් එකේ හිරවෙලා හිටියා කියලා කියන්න බැනේ!!! ඉතින් කොහොමහරි අපිව ගන්න එන්න කියලා තිබේ ඉස්කෝලෙකට අපි එතනට ගියාට පස්සේ ළමයි ටිකකට වොෂ්රූම් යන්න ඕනේ වෙලා මැඩම් ට එක කියන්න බයවෙලා ඒ ළමයි දඟල දඟල හිටියා. පස්සේ ඒ ඉස්කෝලේ වොෂ්රූම් එකට ගියා. අපි ආපු බස් එකට 11 වසරේ අක්කලාත් ආවා අපි හිරවෙලා ආවේ.මගේ ඇඟතැලීලම එදා කෙට්ටු වුණාද මන්දා. ගෙදර ආවට පස්සේ කටහඬත් කොහෙද දන්නෑ.... කොහොමහරි අපි හැමෝම එකට ගියපු මැච් එකක් ඉවර වුණා.

# අවුරුදු Season

අපේ ඉස්කොලේ අවුරුදු උත්සවේට අපි හැමෝම ගවුම් අඳින්න ඕනේ.ඉතින් අපි හැමෝම ගවුම් ඇන්දා.අපේ පන්තියට පවුලක් තිබුණා.ඉතින් අපි හැමෝම උදේ ඇවිත් ඇඳුම් ඇඳගෙන කෑම මේසේ හදාගෙන ඉඳගෙන ඔක්කොමලා කාලා ගියා. ඉස්කොලේ අවුරුදු උත්සවයට අපිට මැඩම් කියලා තිබුණේ කොණ්ඩේ කඩාගෙන ස්ටයිල්ස් දාන්න එපා ගොතලා ඉන්න කියලා ඉතින් අපේ පන්තියේ ළමයි විතරක් කොණ්ඩේ ගොතලා හිටියා.ළමයි අවුරුදු ක්‍රීඩා කරා.සිංදු කිව්වා.අපි නම් ගොඩක් කරේ අනිත් අයගේ සපත්තු දාගෙන ඇවිද ඇවිද හිටියා.අපිට කොහොමත් ට්‍රැක් නිසා ! ගොඩක්ම කාපු එක විතරයි.

මට එදා ගේන්න කියලා තිබ්බේ කෙසෙල්, අවුරුදු මේසේ තියන්න....ඒත් ඒක ඉවර වුණේ නෑ.... අපි ඒ නිසා 9යේදී ප්‍රසිද්ධම Truth and dare එක එක කරා.... එකේ හැම dare එකේම වුනේ කෙසෙල් ගෙඩි 4ක් හරි 3ක් හරි කන එක කොහොමහරි මගේ කෙසෙල් ඇවරියම ඉවර කරගත්තා.

# School Trip

අපි හැමෝම 2024 අන්තිමට එකට යන ට්‍රිප් එක තමී ඒ. අපි හැමෝම ගියේ ගාල්ලේ . අපි එහෙට යනකන්ම නටන ගමන් තමා ගියේ . මේ අපේ පාසල් ට්‍රැක් ගමන කියලා නම් කරමී.ඒත් මට වුණු අකරතැබ්බයක් ! එදා ළමයෙක් අච්චාරු ගෙනත් තිබ්බා ී අපේ ළමයි ඉතින් දඟලනවා නේ අච්චාරු එක මගේ ඇග ඇතුළට වැටුණා . එකේ තිබ්බ මිරිස් නිසා මගේ ඇඟම තුවාල වුණා .

පස්සේ මම මගේ වතුර බෝතලේම මගේ ඇඟට හලා ගත්තා . ඊට පස්සේ මට දිව්‍යා ගවුමක් දුන්නී . ඇද ගන්න කියලා අපි මැඩම් ට බය නිසා ඔය කිසිම දෙයක් කිව්වේ නෑ . ී ඒත් තුවාල වෙලා නිසා මං පොඩ්ඩක් ඇඬුවී . මම ඒ වෙලේ කියපු එකම වචනේ ''දනවා දනවා'' කියලා විතරයී (ඒත් පොඩ්ඩක් විතර මැරෙන්නත් වගේ කෑ ගහලා)කොහොම හරි අපි ගාල්ලට යනකන් අපි හයිවේ තමා ගියේ ඉතින් අපිට නැගිටින්න බැරි වුණාට ඉදගෙන සිංදු කිව්වා. කොහොමහරි හයිවේ එකෙන් එළියට ඇවිල්ලා අපි ටිකක් වෙලා නවත්තන් හිටියා අනිත් බස් එනකන් අපි ඒ වෙලෙත් ෆන් එක තමා ගත්තේ කොහොමහහරි අපි ගාල්ලට එනකොට ටිකක් හවස් වුණා . ඒ කියන්නේ දවල් 12ට විතර අපි ඇවිත් රිච්මන්ඩ් කාස්ටල් කියලා ඉස්සර හිටපු කෙනෙක් හදපු බංගලාවකට ගියී . ඒක ගොඩක් ලොකුයි ගොඩක් අය කියනවා එකේ හොල්මන් ඉන්නවා කියලා . අපි නම් ඇති හොල්මනක් දැක්කේ නෑ. ඉතින් අපිට ඒ බංගලාව ගැන ගොඩක් දේවල් කියලා දුන්නී . අපි ඒවා අහගෙන හිටියේ නෑ ඒ

වුණාට අපි ඒකට වෙලා ගොඩක් ෆොටෝස් ගත්තා . අපි එතනින් පිටත්වුණෙත් ගොඩක් පරක්කු වෙලා අපිට ඉතින් ගොඩක් තැන් බලන්න බැරි වුණාට අපි ඒ හැමවේලේම ෆන් එක ගන්න අමතක කරේ නෑ අපි කොග්ගලට ඇවිත් අපේ කෑම ගත්තා . එදා කෑම එක මොකක්ද කියලා හිතාගන්න බෑ. එක කෑවට වඩා හොඳයි නිකන් ඉන්න එක තිබුණු ඇඳුම් භෞතිකස්තු බලන්න තමයි තිබ්බේ එතනට ගිහිල්ලලත් ගොඩක්ම කරේ විකාර . මායි විනුදි චමල්යි තිනාලි පබෝදි තමා කලින් ම කොග්ගල බලලා ඉවර කරේ . ඇත්තටම බැලුවා කිව්වට බැලුවෙම නෑ.කතා කර කර ඇවිද්දා කොහොමහරි අපි බලලා ඉවරවෙලා පන්තියෙම ඉතින් ඕක බලලා ඉවර කරනකොට තව වෙලා ගියා හැමෝම ආවාට පස්සේ අපි ගෲප් ෆොටෝස් ගත්තා. අපි එතනින් පිටත්වෙනකොටත් පරක්කු වෙලා හිටියේ අපි එතන ඉඳන් තව කොහේදෝ හිටපු කැස්බෑවෝ ටිකක් බලන්න එක්කන් ගියා ඒ යන ටිකෙත් අපි කරේ පිස්සෝ වගේ නටපු එක විතරයි.අපි එතනට ගිහින් කැස්බවෝ බැලුවා කැස්බෑවෝ මිනි මස් කනවා කියලා දැනගත්තේ එදා තමයි අපි ඇඟිල්ල දාන්න යනකොට තමා අපිට කිව්වේ උන් කනවා කියලා අහ! තව එතන කැස්බෑ පැටියෙකුත් හිටියා මන් නම් කලින්ම හිතුවේ ඌ ඉබ්බෙක් කියලා මං බලන් හිටියේ ඌව cartoon වල වගේ කපුටෙක් උස්සන යනකන්.ගෑනු ළමයි මුහුද ලඟට ගියාම සැර වැඩිවෙනවලු! මං නම් හිතන්නේ මුහුද කොහොමද දන්නේ අපි ගෑනු ළමයි කියලා ඊළඟ පාර පිරිමි ළමයි වගේ යන්න ඕනේ බලන්න

කෙහොමහරි අපි කැස්බෑවෝ ටික බලලා එළියට ආවා එතකොට එච්චර පරක්කුවෙලා තිබ්බේ නෑ ඒත් අනි ක් classes ළමයි බලනකන් අපි එළියට වෙලා හිටියා බස් එක ළඟී අපිට මුහුදට යන්න දුන්නේ නෑ අපි කොග්ගල ගාව අයිස් ක්‍රීම් ගත්ත අන්කල් අපි හිටිය තැනටත් ඇවිත් හිටියා.ඒ අන්කල් අපේ පස්සේ ඇවිත්ද කොහේදෝ. අපි ඒ අන්කල්ගෙන් ආයෙත් අයිස්ක්‍රීම් අරගෙන මුහුද දිහා බලාගෙන කකා හිටියා. තව අපි ෆොටෝස් ගත්තා. අපි එතනින් පිටත්වනකොටම 6.45 විතර වෙන්න ඇති. අපි නැග්ග ගමන්ම අපිට කන්න මොනවදෝ දුන්නා . අපි ගෝල් ෆෝර්ට් එක ළඟට ගිහින් ජනේලෙන් ඒක දිහා බලන්න කිව්වා අපි මුකුත් දැක්කේ නෑ. ගොඩක් කළුවරයි ඇත්තටම කිව්වොත් එතනට යනකොටත් 7 යි අපිට ගෙදර යන්න ඕනේ වුණේ නෑ. අපි කොහොමහරි හයිවේ එකට දැම්මම හිටගන්න බෑ අනිත් bus වලනම් හිටගත්තා අපිට බෑ අපි නීතිගරුකයි.ඒ නිසා අපිට දුන්න කෑම කන්න ගත්තා. මෙලො රහක් නැති නිසා සමහර අය කෑවේ නෑ සමහර අය විසිකරලා බයේ හිටියා අහුවෙයි කියලා ිඅපි පැය 5ක්ම ඉඳගෙන ඉන්න ඕනේ නිසා සමහර අයට නින්ද ගියා .ඒත් ඉතුරු අය තමා හොඳම වැඩේ කරේ නිදියගෙන ඉන්න අයගේ ෆොටෝස් ගත්තා මමත් නිදයන් තමා හිටියේ. එත් මට එහා පැත්තේ එක්කෙනාගේ (විනුදි) ෆොටෝ එක ගන්නකොටම මන් නැගිට්ටා. ඊට පස්සේ අපි හොරෙන් බඩගාගෙන ගිහින් ෆොටෝස් ගත්තා මැඩම් ලා දෙන්නත් නිදි අපි ඉතින් යන සිංදු කිය කිය ලිඳ ළඟ සංගමේකුත් දාගෙන හිටියා ිඅපි ළඟ තිබුණු අන්තිම ෆැන්ටා බෝතලේ කැඩුවේ මං. හොල්ලලා හොල්ලලා ඇරියට පස්සේ

ෆැන්ටා බෝතලෙන් බාගයක්ම එලියේ. ඒකත් අමුතු ෆන් එකක් ඒකත් ඉවර කරී.හයිවේ එකෙන් එලියට එනකොටත් පන්තියේ ළමයි භාගෙට භාගයක්ම නිදී අපි ඉතින් එයාලාව නැගිට්ටලා ආයෙත් ෆන් එක තමා ගත්තේ අපි 11.00 ට විතර තමා හයිවේ එකෙන් එළියට එන්න ඇත්තේ .අපිට තව යන්න තියන නිසා සිංදු කිය කිය ෆන් එක උපරිමයෙන් ම ගත්තා ිහරියට 12.00 අපි නිදියන් හිටපු මැඩම්ලාවත් නැගිටින්න.

අවදි වන්න//

දීප්තිමත් දිනකි උදාවෙලා තියෙන්නේ සිතනවාට... වඩා සිංදු හයියෙන් කිව්වා ිමැඩම්ලත් නැගිට්ටා ඒ නිසා ආයෙත් ෆන් ම තමා අපිට ඉතින් මැරුණත් ෆන් එක තමා ගන්නේ ඇයි අනේ අපි මෙහෙම.

කොහොමහරි මාතලේ හරියේදි අපිට වොෂ්රූම් යන්න තැනකින් නැවැත්තුවා එතකොට තමා තේරුණේ එයාලා කොච්චර අමාරුවක් දරාගෙන හිටියාද කියලා. මුලු බස් එකම බැහැලා වොෂ්රූම් ඇතුලේ ඒ මදිවට ඒ දොරෙන් ඇතුල පෙනවා හොඳම වැඩේ තමා වෙන ඉස්කොලේක රග්බි ටීම් එකක් මැච් එකක් ඉවරවෙලා ඒගොල්ලන්ගේ බස් එකේ ඉන්නකොට තමයි අපේ ළමයි මරන්න පන්නනනවා වගේ දුවලා තියෙන්නේ. වොෂ්රූම් ගිහින් ඉවරවෙලා තමයි මෙයාලටත් සිහිය ඇවිල්ලා තියෙන්නේ ලැජ්ජාව ඉතින් කොහෙන් ඉවර කරන්නද. අපි කොහොමහරි ඉස්කෝලෙට එනකොට උදේ 3 හරි 4ට කිට්ටුයි අපිට ඕවා වැඩක් නෑ. ෆන් එක

ගන්නකොට අහ මට කියන්න බැරි වුණා මගෙ හැරිච්ච ටිකක් තියනවා lmds ඩ්‍රාමා එකේ ප්‍රොප්ස් හදන්න අපේ ගෙදර යාළුවෝ 2ක් විතරයි ආවේ ඊට පස්සේ මගේ අත තුවාල වුණා ටිකක්. ඒ වැඩ කරනකොට ඉතින් අපි ඒ පොඩි තුවාලේ ලොකුවට තමයි බැඳගෙන ආවේ ගොඩක් තුවාල වුණා කියලා පෙන්නන්න ඒත් ට්‍රිප් එක ඉවරවෙලා එනකොට බැන්ඩේජ් එකත් නෑ, තුවාලෙත් නෑ එතරම් හොඳට නටලා ි.අපි තව කළුතර බෝධියකටත් ගියා. ඒකෙන් අපිට හරියට තැන හොයාගන්න බැරුව පන්සල වටේම ඇවිද්දා සෙරෙප්පු නැතිව කකුල් පිච්චි පිච්චි දුවන්නත් හොඳ නෑනේ. මං හැමවෙලේම කියනවා වගේ අපේ පන්තියටම ට්‍රැක් නිකන් නෙවෙයි හොඳටම ට්‍රැක් අපි කොහොමහරි පන්සල් ගිහිල්ලා බෝධිය වැඳලා ගියා. මේ වගේ ට්‍රිප් එකක් මට ආයේ මගේ ජීවිතේ යන්න තිබ්බොත් ඇති

# GRADE 9 L.M.D.S

මම කලින් ලියලා තියෙන්නෙ grade 8 වලදි තිබ්බ lmds එක ගැන 8 වගෙ දවස් ආයේ එන්නේ නැති වුණාට ග්රේඩ් 9 කියන්නේ අපිට memories ගොඩක් දුන්න දවස් ටිකක් කලින් chapter එකේ තුවාලයක් ගැන ලියලා තියෙන්නේ ඒක මේකට එන්න ඕනේ.හැබැයි එක ඉවර වෙනකන් අපිට කොච්චර ඉවසන්න උනාද කිව්වාත් හැමදාම කරේ කල් යනවා කියන එක විතරයි.ඒ හින්දම අප් ඉවර compitition බලං හිටියා.

අපේ class ටීචර් චමිලා මැඩම් තමයි english කරේ.ඉතිං අපි ඒ මැඩම් එක්ක තමා කරන හැමදේම කරන්න ඕනේ.ඒත් ඉතින් අපි කවුද කියලා අපිනේ දන්නේ අපිට ප්ලේස් එකක් ගන්නම ඕනේ.අපිට මැඩම් permition දෙන්නේ නෑ.period cut කරලා යන්න. අනික ලොකුම දේ වුනේ class teacher හින්දා අපිට කොහොමත් first piriod එකේ තිබ්බේ English. එකේ ඉඳලා ඉතුරු හැම එකේම අපි practice කරනවා.සමහර වෙලාව මැඩම් ට අහුවෙලත් තියෙනවා.අපි ඉතින් හැමදාම practice කරේ auditorium එක පිටිපස්සේ නේ.

මොනා නැතත් ෆන් එකක් නම් ගත්තා.අපි props එහෙම හදන්න සහන්සාලාගේ ගෙදර ගියා.එහේ ගිහිල්ලත් ඉතින් අපි කරේ ෆන් ගත්ත එක කරෙත් පැය ගානක් ඉඳලා ඒත් සම්පුර්ණ කරන්න බැරි වුණා.මං කලින් කිව්වා වගේ අපේ compitition එක කල් ගියා.ඒ

හින්දම එච්චර දේවල් වුණෙත් නෑ.හැබැයි props හදන්න කියලා ඉස්කොලේ නොගිය තැනක් නෑ.මම 8 වසර drama එකගැන කියද්දි කිවව් ගබඩා කාමරෙන් ආපි බඩු ටිකක් හොයාගත්තා.ඒ ටික හංගලා තිබ්බේ art room එක ඉස්සරහ මේසෙ යට හවසට අපි ඇවිල්ලා වැඩ කරනවා.

ඉස්කෝලේ තියන පරණ බිල්ඩින් එකක් හින්දා හවසට හොල්මන් වගේ.ඒත් අපි වැඩ smart board සිංදු දාගෙන පිස්සු නටනවා.අපි කොහොමත් හවස් 5.30විතර වෙනකන් ඉස්කෝලේ ඉඳලා වැඩ කරනවා.

ඉස්කේලේම මාරම පාලුයි හවසට එක දවසක් අපි හැමෝම එලියට එනකොට දොර වහලා තිබ්බා.අපි ටික වෙන දොරක් හොයාගෙන එලියට ඇවිත් බලනකොට ළමයි වගයක් නෑ.අපි පට්ටම බය වෙලා හිටියේ.හොල්මනක් වත් ඇවිත් උස්සන් ගිහින්ද කියලා.මොකද එදා ජනෙල් ඔක්කොම වහලා කලුවරයි.

කොහොමහරි එයාලා ආවට පස්සේ තමා අපිට සැනසීමක් දැනුනේ.කොහොමහරි එතන වැඩේ හරියන්නේ නැති නිසා අපි බඩු ඔක්කොම පන්තියට ගෙනවා.ඒවා බාගෙට හදලා තියෙන නිසා ඒවා නිකන් කුණු වගේ. ඒ නිසා එන හැම මැඩම් කෙනෙක්ම වගේ අහන්නේ මොනාද මේ පන්තිය පිටිපස්සේ තියෙන කුණු හැටි බලන්න ළමයි කියලා බනින එක.චාරුක සර් තමයි හොඳටම කරන්නේ.ඒ සර්ට කෙහෙමෙත් අපේ පන්තියත් එක්ක පිස්සුවක් තියෙනවා.මොකද අපේ smart board එක සර් ආවාම පිස්සු නටනවා.අනිත් එක දෙපැත්තේ පන්ති කෑ ගහන එක ඒ මදිවට අපිත්

කෑ ගහනවා. අනික ඒ සර්ට පුදුම ආසාවක් තියෙන්නේ අපේ පන්තියට විහිලු කරන්න.ස්මාර්ට් බොඩ් එක පිස්සු නටනකොට අපි වගේලු.ඉතින් සර් අර කුණුගොඩ දැක්කම තව විහිලු කරනවා.ඒ සර් පට්ට ෆන් ''තමුසෙලා වගේමයි'' මේ වචන ටික දවසට එක පාරක්වත් කියනවාමයි. රිලවෙක් දැක්කත් කියනවා

අපි කොහොමහරි පන්තියේ ඉඳලත් props හැදුවා. කට්ටියක් අපේ ගෙදරත් ආවා.කට්ටියක් සහන්සා ගෙ ගෙදරත් ගියා.මොනා නැතත් අපි හිතන් හිටපු විදයට කරගන්න බැරි වුනා.මොකද 9-A එකෙන් drama කරන්නේ නෑ කියලා අපි දන්නෙ ඒ වෙලාවේ.අක්කි කෙනෙක් ඇවිත් කිව්වා අපි තමා දැන් presant කරන්න ඉන්නේ ඉක්මනට එන්න කියලා.

එදා තමා මහ අමුතුම දවස මාස ගානක් එක ඇදුනා.ඒත් අන්තිම වෙලාවේ කිසිම එකක් නැතුව ගිහින් කරන්න කිව්වේ.අපි බාගෙට බඩු හදාගෙන හිටියා. drama එක මැදදී සමහර ඒවා වැටෙනවා. අපි smoke machine එකක් ගෙනත් තිබ්බා එක වැඩ කරෙත් නෑ හරි වෙලාවට charcter එක drama එකේ ඇක්ට් කරන ගමන් ඉන්නකොට හදනවා. drama එකේ part එකක් වගේ අපි සමහර props වැටෙනකොට අල්ලන් ඉන්නේ. ඒ මදිවට මං මාස ගානක් ඇඳුමක් අදින්න ඩයට් කරා....එදා හවසම මං ඩයට් පැත්තකට දාලා පරාට 2ක් කෑවා.drama එක දවසේ තමා පිස්සුව වැඩිම වුනේ.

කොහොමහරි result දෙනකොට place එකක් නැතුව ඇති කියලා හිතුවේ. 9-F English Medium Class එක නිසා අපි කිසිම බලාපොරොත්තුවත් නැතුව හිටියේ අපි second වුණා.දැනුන සතුට.අපි එකෙක් අපිට මාරම ගැම්මක් දැනෙන්නේ ළමයි තනියම එකතු වෙලා place කරා කියන්නේ දැනෙන සතුට කියන්න තෙරෙන්නෙ නෑ....මාරම jolly කාලයක්

# 2023/24

2023, 2024 කියන්නෙම මගේ ජීවිතේට ලැබුණු හොඳම යාළුවෝ හම්බුණ කාලයක්, කොච්චර එපා කරපු අවුරුද්දක් වුණත් ඉස්කෝලේට ගියාම දැනුන සතුට මාරම දෙයක්.

2023/24 කරපු සමහර විකාර පිස්සු වැඩ මතක් වෙද්දී මොනවද අපි නොකරේ කියලා හිතෙනවා.ඒ වෙද්දී අපි යහළුවෝ අතර හදාගෙන තිබුණු bond එක මාරම ලොකුයි.සමහර අයට හොඳම යාළුවෝ කියලා වෙනම හිටියට මට නම් පන්තියම හොඳම යාළුවෝ තමයි.අපි එකිනෙකාට අපි හිටියා.

අපි රණ්ඩු කරනවා, කෑ ගහගන්නවා, මරාගන්නවා, ඒත් කාටහරි මොනාහරි වුනොත් පන්තියම එයත් එක්ක හිටපු කාලයක් තිබුණා.

අපි 9 වසරේ ඉන්නකොට share කරගත්ත දේවල් ගොඩක් තිබුණා.අනික් classes වලට සාපේක්ෂව අපේ class එකේ bond එක මාරම ලොකුයි.කොහොම කොහොමහරි අපි 9 වලින් 10 වලට එනකොට classes suffer කරනවා.

ඒ අපිව මාරු කරපු දවසත් මාරම අමුතු දවසක් අපි හැමෝම bags දාගෙන පෝලිමට හිටගෙන හිටියේ අපි හැමෝටම ආයෙත් එකම class එකේ ජීවිතේට එකට ඉන්න බැරි වෙනව කියලා දැනගෙන මාරු කරන්නත් කලින් සමහර අය අඬන්න ගත්තා.

අපේ නම් කියද්දී මාරම අමුතු feeling එකක් දැනුනේ කොහොමහරි අපි පන්ති 5කට බෙදුණා.හැමෝම මාරටම ඇඬුවා.ඒක මාරම දුකක්.

අපි හැමෝම හිතුවට ඒ bond එක කැඩෙයි කියලා. සමහර අය තාමත් අපිත් එක්ක ඒ විදයට ම ඉන්නවා. හැමෝටම එකම විදයට ඉන්න බෑ. ඒක පිලිගන්නම වෙනවා.ඒක ලෝක ස්වභාවය සමහර අය හිටපු විදියටම තාමත් ඉන්නකොට සමහර අය මාරටම නපුරු වෙලා වෙනස් වෙලා. ගොඩක් වෙනස් වෙලා

මොන දේ වුනත් එයාලත් තාමත් අපිත් එක්ක ඉස්සර memories වල හිටියා. ඒ නිසා එයාලව අමතක කරන්න කොහොමත් බෑ.

පොත අවසානෙට ආවට යාළුකම හැමදාමත් තියේවී.

මම මේ පොත ලියන්නෙම ඒ මතකයන් අමතක නොවෙන්න ඕනේ නිසා, මෙතෙක් ලැබුණු හොඳම මතකයන් සහ යාළුවෝ තමයි ඒ හැමෝට ම මම මාරම ආදරෙයි...

# නිමි.

විදුහල්පතිනිය
මහාමායා බාලිකා
විද්‍යාලය

පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට

ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලූ ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)